**තිරුක්කෝවිල් ප්‍රාදේශීය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**
**-----------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 15 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින සභාපතිවරයාට වෙත යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට තිරුක්කෝවිල් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

### (අ) ගිණුම්කරණ අඩුපාඩු

| | ගිණුම්කරණ අඩුපාඩු | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සභාව සතු ඉඩම්වල වටිනාකම් තක්සේරු කර ගිණුම්වල දක්වා නොතිබුණි. | ඉඩම්වල වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කළයුතු වේ. | ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. |
| (ii) | සභාව සතු සභාව විසින් ප්‍රයෝජනයට ගනු ලබන වාහන 12 ක වටිනාකම තක්සේරුකර ගිණුම්වල දක්වා නොතිබුණි. | මෝටර් වාහන වල වටිනාකම් ස්ථාවර වත්කම් යටතේ පෙන්විය යුතු වේ. | වාහන වල ජීවිත කාලය , ක්ෂය ප්‍රමාණය අවසන් වටිනාකම තක්සේරු කර 2019 වර්ෂයේ අවසාන ගිණුම්වල පෙන්වීමට කටයුතු කරනු ලැබේ. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ සහ 2017 වර්ෂයේ පරිත්‍යාග වශයෙන් ලැබුණු පිළිවෙලින් 105 සහ 104 පොත්වල වටිනාකම ගිණුම්වලට ගෙනවිත් නොතිබීමෙන් සමුච්චිත අරමුදල සහ ස්ථාවර වත්කම් අඩුවෙන් දක්වා තිබුණි. | අදාල කාලවලදි තක්සේරු කර වටිනාකම ස්ථාවර වත්කම් යටතේ දැක්විය යුතුවේ. | දැනට එහි වාහනයට රු. 35,805 ක් ලෙස තක්සේරු කර ඇත. 2019 වර්ෂයේ ගිණුම්වලත් ඒවා දක්වන බව දන්වා සිටිමි. |
| (iv) | 2017 වර්ෂයේ ජාතිය ශක්තිමත් කිරීමේ වැඩ සටහන යටතේ තම්පිලුවිල් මහජන පොල කඩ කාමර රු. 16,867,702 ක් වියදමින් පුළුල් කරන ලද අතර, පරණ මහජන පොල | පැරණි මහජන පොල ගොඩනැගිල්ල වටිනාකම තක්සේරුකර | පැරණි ගොඩනැගිල්ලේ වටිනාකම රු. 1,600,000 ක් 2019 වර්ෂයේ ගිණුම්වල අඩුකර පෙන්වමි. |

| | |
|---|---|
| ගොඩනැගිල්ලේ වටිනාකම ගිණුම්වලින් අඩුකිරීමට කටයුතු කර නොතිබුණි. | ගිණුම්වලින් අඩුකිරීමට කටයුතු කළ යුතුවේ. |

**(ආ) ලේඛනමය සාක්ෂි නොමැති වීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඉඩම් ඔප්පු, ස්ථාවර වත්කම් ලේඛනය, අයිතිය තහවුරු කෙරෙන ලියවිලි, සමීක්ෂණ වාර්තා හා අත්තිකාරම් ලේඛනය ආදි තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.98,151,566 ක් වූ ගිණුම් විෂයයන් 5 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ ගිණුම් ශේෂ සනාථ කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. | 2013 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශයෙන් වෙන්කර ගත් ඒවාය. ඒවාට ලේඛනමය සාක්ෂි ලබා ගැනීමට නොහැකිය. ඉදිරියේදි ලබා ගැනීමට කටයුතු කරමි. |

## 1.4 අනුකූල නොවීම

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 12(1) සහ (2) වගන්තිය සහ පළාත් පාලන නිවාස සහ ඉදිකිරීම අමාත්‍යාංශයේ 1988 ජනවාරි 13 වන දිනැති අංක 488/16 දරන ගැසට් නිවේදනයේ 31(1) උප වගන්තිය | ප්‍රාදේශීය සභාවල කටයුතු පහසු කිරීමේ අදහසින් ස්ථාවර තීරණ ලබාගැනීම සඳහා සභාවේ ප්‍රතිපත්ති සැලසුම් කිරීමේ, නිවාස ඉදිකිරීම සමාජ සංවර්ධන, තාක්ෂණ සේවා, පරිසර හා පොදු පහසුකම් යන කරුණු සඳහා වෙන්වෙන් වශයෙන් කමිටු පත්කර තිබුණද එම කමිටු අද දක්වා රැස්වීම 02 ක් පමණක් පවත්වා ඇත. | අදාල පනත අනුව ගැසට් පත්‍රයේ දැන්වීම අනුව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදි රැස්වීම් පවත්වා රාජකාරි පහසු කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | අයවැය සමඟ අය සහ වැය විෂයයන් සසඳා අතිරික්ත හා ඌනතා වලට හේතු දැක්වෙන | අදාල රීති අනුව කටයුතු කළ යුතු වේ. | කලින් මෙවැනි ලියවිලි ඉල්ලා නොතිබුණි. ඉදිරි ගිණුම් වාර්තාව පිළියෙල |

| | | | | |
|---|---|---|---|---|
| | වගන්තිය 193 | ප්‍රකාශනයක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | | කිරීමේදී මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | වර්ෂ දෙකක් ඉක්මවූ කල් ඉකුත්වූ තැන්පත් 44 ක් සම්බන්ධයෙන් අදාල පුද්ගලයින්ට ආපසු ගෙවීමට හෝ ආදායම් ගිණුමට මාරු කිරීමට කටයුතු කර නොතිබුණි. | කල් ඉකුත්වූ තැන්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | මේවා හඳුනාගෙන අවශ්‍ය කටයුතු කර 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරමි. |
| (ඈ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/2 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක උපාංග හා මෘදුකාංග 11 ක් සම්බන්ධයෙන් වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. | අදාල භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතු වේ. | සටහන් කර ඉදිරියේදි ඉදිරිපත් කරමි. |

### 1.4.2 බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2012 වර්ෂයට පෙර අයකර ගෙන තිබු ජාතිය ගොඩ නැගීමේ බද්ද රු. 32,412 ක් සහා වැට් බදු හා මුද්දර බදු රු. 34,132 ක් වශයෙන් එකතුව රු. 66,544 ක් සම්බන්ධ ලියවිලි කිසිවක් නොමැතිව වර්ෂ 08 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | විස්තර රැස්කර දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට යැවීමට කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමෙදි ආදායම් බදු දෙපාර්තමේන්තුවට යැවීමට හෝ ආදායමට මාරු කිරීමට කටයුතු කරනු ලැබේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.6,932,720 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,005,795 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

------------------------

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්**

--------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2018<br>ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2017<br>ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 13,500 | 4,000 | 9,110 | 2,112 | 40,000 | 5,648 | 5,648 | 7,222 |
| කුලී | 3,425,000 | 3,850,642 | 3,928,518 | 2,474,142 | 3,295,000 | 3,378,113 | 3,213,038 | 2,552,018 |
| බලපත්‍ර ගාස්තු | 667,500 | 697,410 | 708,135 | 7,230 | 687,500 | 586,000 | 586,000 | 17,955 |
| වෙනත් ආදායම් | 4,216,000 | 11,362,572 | 11,362,572 | - | 6,405,000 | 2,343,391 | 2,343,391 | - |

**2.2.2** කුලි
----

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) රු. 934,190 ක්වූ හිඟ කුලි ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායම් නිසි කාලයේදී අයකිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ කටයුතු කරන බව දන්වමි. |
| (ආ) සභාවේ බල ප්‍රදේශයේ ස්ථාපිත කර තිබූ සන්නිවේදන කුළුණු 07 ක් සඳහා වෙළඳ බලපත්‍ර ගාස්තු සමාලෝචිත වර්ෂයේ අයකර ගෙන නොතිබුණි. | හිඟ ආදායම් නිසි කාලයේදී අයකිරීමට කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂයේ 2018 හිඟ මුදල සමග අයකර ගැනීමට කටයුතු කර ඇති බව දන්වා සිටිමි. |
| (ඇ) 2018 දෙසැම්බර් 31 ට බදුකරුවන් 84 දෙනකුගෙන් හිඟ බදුකුලි රු. 1,539,952 ක් සමාලෝචිත වර්ෂයේදි අයකර නොතිබුණි. | හිඟ ආදායම් නිසි කාලයේදී අයකිරීමට කටයුතු කළ යුතු වේ. | ගෙවීම් පැහැර හරින අයට එරෙහිව නීතියානුකූලව කටයුතු කිරීමට තීරණය කර ඇත. |

**2.2.3** උසාවි දඩ සහ මුද්දර ගාස්තු
------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභා ප්‍රධාන ලේකම්ගෙන් සහ වෙනත් බලධාරින්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ මුදල රු. 406,666 ක් සහ මුද්දර ගාස්තු රු. 3,151,200 ක් අයවීමට ඇත. | ලැබියයුතු ආදායම් අදාල කාලවලදි අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | වර්ෂය අවසානවීමට ප්‍රථම ගණනය කිරීමට නොහැකිව ඇත. අදාල ආයතවලින් ලබාගන්නා දැන්වීම්, ඉල්ලීම් පදනම් කරගෙන ඉදිරි කටයුතු කරන්නෙමු. ඒ අනුව ගිණුම් වාර්තාකරණයෙන් පසු විස්තර ලැබේ. දැනට සියළු කටයුතු නිමකර ඇත. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**
---------------------------

**3.1** **කළමනාකරණ අකාර්යක්ෂමතා**
----------------------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විවරණය, පහසුව හා සුහසාධන යන සභාව විසින් ඉටුකළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කරීම් පිළිබඳව අනාවරණයවු කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත් 126 වගන්තිය අනුව, ප්‍රධාන කරුණු 20 ක් සඳහා අතුරු ව්‍යවස්ථා සකස්කර ක්‍රියාත්මක කළ යුතු වුවද, කරුණු 19 ක් සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා සකස්කිරීමට අවශ්‍ය කටයුත සභාව විසින් කර නොතිබුණි. | අනුමැතිය සඳහා යවන ලද අතුරු ව්‍යවස්ථා වල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. සභාවට අදාල වෙනත් කරුණ සම්බන්ධයෙන්ද අතුරු ව්‍යවස්ථා සකස්කිරීමට කටයුතු කළ යුතු වේ. | අතුරු ව්‍යවස්ථා සකස්කිරීම සම්බන්ධයෙන් 2019 මැයි මස සභා වාරයේ සාකච්චා කර ඇත. සුදුසු අතුරු ව්‍යවස්ථා සකස්කරන බවත් පනවන ලද අතුරු ව්‍යවස්ථා වලට අදාල වෙනස්කම් කර ගැසට්පත්‍රයේ පළ කිරීමට කටයුතු කරමි. |

(ආ) ක්‍රියාකාරි සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අනුමත කර තිබූ ඝණ අපද්‍රව්‍ය අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ක්‍රියාත්මක කළයුතු ප්‍රධාන කාරණා සම්බන්ධයෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් සකස්කළ යුතු වේ. | වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් සකස්කිරීමට කටයුතු කරමි. |

(ඇ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු මන්ඩානෙයිහි පිහිටුවා ඇති ඝණ අපද්‍රව්‍ය එකතු කිරීමෙ මධ්‍යස්ථානයේ පොහොර සඳහා ඉල්ලුමක් නොමැතිවීම සහ අලෙවි කිරීමේ ක්‍රමයේ අවිධිමත්බව හේතුවෙන් මාස 05 ක් පමණක් නිෂ්ක්‍රියව පවතින බැවින් සභාවේ ආදායම් අහිමිවී ඇත. මේ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | කොම්පොස්ට් පොහොර සම්බන්ධයෙන් දැනුවත්කර විධිමත් අලෙවි කිරීමේ ක්‍රමයක් මගින් සභා ආදායම වැඩිකර ගත යුතු වේ. | ගොවියාට රු. 350 ක පොහොර සහන මිල පොහොර කි. 50 කෘෂිකර්ම දෙපාර්තමේන්තු වෙත ලැබෙන බැවින් කි. 50 කින් රු. 150 ක් ඉතිරි කළ හැකිවීම නිසා එම පොහොර භාවිතයට ගොවින් කැමැත්තක් දක්වන බව දන්වමි. |

(ඇ) පරිසර ගැටළු

---------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මණ්ඩානෙය ඝණ අපද්‍රව්‍ය මධ්‍යස්ථානය මාස 05 ක්‍රියාත්මක නොවීම නිසා කසල වර්ගීකරණය නොකර එකතුවී තිබුණි. | ඝණ අපද්‍රව්‍ය වර්ගීකරණය කර ලබා ගත යුතු වේ. | මෙම ස්ථානයේ කසල පිරී ඇති නිසා පස් දමා පිරවිය යුතුව ඇත . අළුතින් ස්ථානයක් ප්‍රාදේශීය ලේකම්ගෙන් ඉල්ලුම්කළ අතර විල්ගමුවේ ස්ථානයක් වෙන්කර ඇති බව දන්වා තිබුණි. එම ස්ථාන පිරිසිදු කිරීම සඳහා අප ගිය අවස්ථාවේදි මහජන විරෝධතාවයක් ඇති විය. වෙනත් ස්ථානයක් ලබාදෙන ලෙස ඉල්ලා ඇත. එසේ ලැබීමෙන් පසු එම ස්ථානය ඝණ අපද්‍රව්‍ය මධ්‍යස්ථාන මාරු කිරීමට කටයුතු කරනු ලැබේ. |

(ඇ) තිරිසර සංවර්ධන ඉලක්ක

-------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව විසින් තිරසර සංවර්ධන සම්බන්ධයෙන් මැනිමට දර්ශක සකස්කිරීම සඳහා කටයුතු කර නොතිබුණි. | ඉලක්ක හඳුනාගෙන එය මැනීම් සඳහා දර්ශක සකස්කළ යුතු අතර එය ලඟා කර ගැනීම සඳහා කටයුතු කළ යුතු වේ. | මැනිමට අවශ්‍ය දර්ශක සකස් කිරීමට පිළිබඳ දැනගෙන ඉදිරියේදි සකස් කිරීමට කටයුතු කරනු ලැබේ. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | කාර්යාලවල ගොඩනැගිල්ල මහජන පුස්තකාල, මහජන පොල සහ මාළු වෙළඳ සැල යන ස්ථාන ඉදිකර ඇති ස්ථානවල ඔප්පු නැතිවී ඇති බව පැවසුවද එහි පිටපත් නැවත ලබා ගැනීමට කටයුතු කර නැත. | ඔප්පු නැවත ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදි නැවත ලබාගැනීමට කටයුතු කරන බව ඔබගේ අවධානය යොමු කරවමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පරිත්‍යාග ලෙස ලැබුණු වාහන 06 ක් සහ ට්‍රැක්ටර් 03 ක් සභාව විසින් ප්‍රයෝජනයට ගෙන තිබුණද, සභාවේ නමට එම වාහන පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභාව විසින් ප්‍රයෝජනයට ගන්නා වාහන සභාවේ නමට මාරුකළ යුතු වේ. | ඉදිරියේදි නිවැරදි කරමි. |
| (ඇ) | 2017 වර්ෂයේදී ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන් යටතේ පහළ විනායකපුරම් බස් නැවතුම් පොල ඉදිකිරීමේ කර්මාන්ත සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ අනුමැතිය ලබානොගෙන රු. 167,000 ක් ඇස්තමේන්තුව මත ආරම්භකර රු. 76,165 මුදලක් වැයකිරීමෙන් පසු මාර්ග සංවර්ධන අධිකාරියට අයිති මායිමේ ඉදිකිරීම නිසා අදාල කර්මාන්ත නිම නොකර මහජන ප්‍රයෝජනයට ගත නොහැකිව තිබුණි. | අදාල වැඩ අවසන් කර මහජන ප්‍රයෝජනයට ලබාදිය යුතු වේ. | දැනට මෙම ප්‍රශ්නය විසඳී ඇති බැවින් කඩිනමින් මෙම වැඩ නිම කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | 1958 අංක 16 දරන සේවක අර්ථසාධක අරමුදල සහ 1980 අංක 46 දරන සේවක භාරකාර අරමුදලට අදාල දායක මුදල් මාසික දළ වැටුප මත ගණනය කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ මූලික වැටුප අනුව ගණනය කර අරමුදල්වලට යවා ඇත. | දායක මුදල් දළ වැටුපට ගණන් බැලිය යුතු වේ. | ඉදිරියේදි දළ වැටුප අනුව ගණනය කිරීමට කටයුතු කරමි. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ සේවකයන් 02 දෙනකුගෙන් රු. 148,738 ක හිඟ සේවක ණය ශේෂයන් තිබුණි. එය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ණය අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මෙම දෙදෙනා මියගොස් ඇත. ඔවුන්ගේ මරණ පාරිතෝෂිකයෙන් අයකර ගැනීමට කටයුතු කරමි. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රදේශීය සභා පනතේ 126 වන වගන්තිය අනුව සභාව විසින් අතුරු ව්‍යවස්ථා පැනවීමට අපොහොසත්වීමෙන් සහා බල ප්‍රදේශයේ පෞද්ගලික ආයතනයන් වලින් ප්‍රචාර කිරීම සඳහා අතිරේකව ස්ථාපිත කර ඇති දැන්වීම් පුවරු සඳහා බලපත්‍ර ගාස්තු අයනොකිරීම නිසා සභාව වාර්ෂිකව රු. | ප්‍රචාරක දැන්වීම් පිළිබද අතුරු ව්‍යවස්ථා පනවා ප්‍රචාරක දැන්වීම් ගාස්තු අයකර සභාවේ ආදායම වැඩිකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | පසුගිය කාලවල තිරුක්කෝවිල් ප්‍රාදේශීය සභාව විසින් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. දැනට අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කර ඇත. අතුරු ව්‍යවස්ථා සම්බන්ධයෙන් 2019 මැයි මාසයේ සභා වාරයේ සාකච්ඡා කර ඇත. සුදුසු අතුරු |

| | | |
|---|---|---|
| 120,000 ක ආදායමක් අහිමිවී ඇත. | | ව්‍යවස්ථා සකස් කරන බවද, එසේ සකස් කරන ලද අතුරු ව්‍යවස්ථා සංශෝධන කර ගැසට්පත්‍රයේ ප්‍රසිද්ධ කිරීමට එකඟවී ඇති බවත් දන්වමි. |

**3.5 වත්කම් කළමනාකරණය**

**3.5.1 වත්කම් ලේඛන ගත නොකිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට සභාව සතු ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම් රු. 205,070,770 ක් ලෙස ගිණුම්වල දක්වා තිබුණද, ස්ථාවර සහ ජංගම වත්කම් ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීන කර ගිණුම්වල හෙළිදරව් කළ යුතු වේ. | තොග ලේඛනය ස්ථාවර වත්කම් සටහන් කර තිබීම නිසා වෙනම ලේඛනයන් පවත්වා නොතිබුණි. තවද, අවසාන ගිණුම් වාර්තාවේ ස්ථාවර වත්කම් වෙනම දක්වා ඇත. ඒවා වෙනම සටහන් කිරීමට කටයුතු කර ඇත. |

**3.5.2 නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගත හැකි තත්වයේ තිබෙන සභාව සතු ට්‍රැක්ටර් 03, පාර තලන යන්ත්‍ර 03 සහ බව්සරයක් අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට වසර 05 කට වඩා වැඩි කාලයක් කටයුතු නොකිරීමෙන් ඒවා ප්‍රයෝජනයට ගත නොහැකි තත්වයට පත්වී ඇත. | වාහන වාර්ෂික සමීක්ෂණ මණ්ඩල නිර්දේශය අනුව අපහරනය කිරීමට හෝ අළුත්වැඩියා කර නැවත ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී ප්‍රතිපාදන ලද හොත් සියළුම වාහන අළුත්වැඩියා කරන බව දැනුම් දෙමි. |

**3.5.3 නිෂ්ක්‍රිය / ඌන උපයෝජිත වත්කම්**

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (අ) | යුරෝපා සංගමයේ මුදල් ප්‍රතිපාදන යටතේ රුපියල් මිලියන 5 ක් වියදමින් ඉදිකර 2017 වර්ෂයේ සභාව භාරගෙන තිබු විනායකපුරම් මහජන පොල ගොඩනැගිල්ල මහජනයා අඩුවෙන් ගැවසෙන ස්ථානයක ඉදිකර තිබීමෙන් | ස්ථාවර වත්කම් ඵලදායි ලෙස යොදවා ගත යුතු වේ. | පොල ගොඩනැගිල්ල ඉදිකිරීමෙන් පසු වෙළඳ කටයුතු ආරම්භ කළායින් පසු විනායකපුරම් ප්‍රදේශයේ මහජනතාව කලින් භාණ්ඩ මිලදී ගත් තම්පිලුවිල් මධ්‍යම |

| | | | |
|---|---|---|---|
| | 2019 මැයි 24 දිනය දක්වා 04 කඩ කාමරවලින් 02 ක් අදාල අරමුණ සඳහා යොදවා ගැනීමකින් තොරව නිෂ්ක්‍රියව තිබුණි. | | පොල හැර විනායකපුරම් පොලේ භාණ්ඩ මිලදී ගැනීම් කර නොතිබීමෙන් භාණ්ඩ විකිණීමට නොහැකි නිසා කඩකාමර ලබා ගැනීමට අකමැත්තක් දක්වයි. |
| (ආ) | තම්පිලුවිල් මධ්‍යය පොලෙහි මහල් කඩ කාමර 12 කින් කඩ කාමර 05 ක් වර්ෂ හතරකට වැඩි කාලයක් ප්‍රයෝජනයට නොගෙන තිබුණි. | සභාවේ වත්කම් ඵලදායි ලෙස යොදවා ගත යුතු වේ. | අපි කිහිප වතාවක් මේ සම්බන්ධයෙන් දැන්වීම් පල කළද වෙළද මහතුන් මෙම කඩ කාමර ලබාගෙන වෙළදාම් කිරීමට ඉදිරිපත් නොවීමෙන් දිගටම මෙම තත්ත්වය පවති. |
| (ඇ) | 2017 වර්ෂයේදී රු. 101,532 ක් වියදමින් කොම්පොස් පොහොර ඇඹරීමේ යන්ත්‍රයක් මිලදී ගෙන තිබුණද, 2019 ජනවාරි මාසයේ සිට යන්ත්‍රය ක්‍රියා නොකිරීම නිසා අදාල අරමුණ සඳහා යොදවා ගැනීමකින් තොරව නිෂ්ක්‍රියව පැවතුනි. | සභාවේ වත්කම් ඵලදායි ලෙස යොදවා ගත යුතු වේ. | මෙව යන්ත්‍රයේ අළුත්වැඩියා ඉක්මනින් කර ගැනීමට තීරණය කර ඇත. |

### 3.5.4 වාර්ෂික භාණ්ඩ හා තොග සමීක්ෂණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදි 2017 වර්ෂයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල විසින් විකිණීමට සහ විනාශ කිරීමට නිර්දේශ කර තිබූ පොත් සහ භාණ්ඩ පිළිවෙලින් 62 ක් සහ 178 ක් 2019 මැයි 24 දින දක්වා ඒ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | සමීක්ෂණ මණ්ඩල විසින් නිර්දේශය කළ කටයුතු අදාල කාලවලදී ක්‍රියාත්මක කළ යුතු වේ. | 2017 වර්ෂයේ ආකෘති 47 හි සඳහන් කර තිබූ භාණ්ඩ දැනට ඇතුලත්කර ඇත. මෙය අනුමැතිය ලද පසු අළුත්වැඩියා කිරීම, විකිණීම හෝ විනාශ කිරීම සිදුකරනු ඇත. |

### 3.6 ප්‍රසම්පාදනය

### 3.6.1 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව සහා අවශ්‍යතා අනුව ප්‍රසම්පාදන සැලස්මක් පිළියෙල කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදි සකස් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |

### 3.6.2 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් නිශ්චිත සංවර්ධන ආදාර යටතේ රු. 500,000 ක් වැය කර මණ්ඩානෙයි හි තිබෙන කොම්පොස් පොහොර නිෂ්පාදන මධ්‍යස්ථානය වටේ අලි වැට පුළුල් කිරීමේ කර්මාන්තය 2018 ඔක්තෝබර් 18 වන දින නිමකර ගෙවීම් සිදුකර තිබුණි. එසේ වුවද, පසු ගිය මාස 5 කට අලි වැටේ විදුලි සම්බන්ධතා ක්‍රියාත්මක නොවීමෙන් නිෂ්කාර්යව අනාරක්ෂව තිබුණි. | මෙය අළුත්වැඩියා කර ආරක්ෂාව තහවුරු කළ යුතු වේ. | මෙය සවිකර කාලවල අලි වැට සඳහා විදුලි සපයන බැටරිය (Battery) ක්‍රියාවිරහිතවී තිබුණි. දැනට මෙය ක්‍රියාත්මක නොවීම නිසා වහාම අළුත්වැඩියා කිරීමට කටයුතු කරනු ලැබේ. |

## 4 ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදි අභ්‍යන්තර විගණනයන් සිදුකර නොතිබුණි. | අභ්‍යන්තර විගණනය අංශයක් ස්ථාපිත කළ යුතු වේ. | අභ්‍යන්තර විගණන කටයුතු වල ලියවිලි පිළියෙල කිරීම සඳහා අභ්‍යන්තර පරීක්ෂණයන් සිදුකර තිබුණද, නිසි අභ්‍යන්තර විගණනයන් සිදුවි නොතිබුණි. ඉදිරියේදි නිසි සැලස්මක් අනුව ක්‍රියාත්මක කරන බව දන්වා සිටිමි. |

### 4.2 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී සභාව විසින් විගණන හා කළමනාකරණ කමිටු ආරම්භකර කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු ආරම්භ කර රැස්වීම් පැවත්වීමට කටයුතු කළ යුතු වේ. | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් මෙතෙක් පවත්වා නොතිබුණි. දැනට ආරම්භ කර ඇත. ඉදිරියේදී නිසි පරිදි රැස්වීම් පවත්වීමට තීරණය කර ඇති බව දන්වා සිටිමි. |